# ජන ගායනාවල සංස්කෘතික පසුබිම

ජනතාව අතර දීර්ඝ කාලයක් තිස්සේ භාවිත වීමෙන් ජන කවි ඔවුන්ගේ පොදු අයිතියක් බවට පත්වී ඇත.ගැමියා විසින් බොහෝවිට තම ජීවන වෘත්තීන් කරගෙන යාමේදී දැනෙන කාන්සිය,පාළුව සහ විඩාව දුරුකර ගැනීම සඳහාත් විනෝදාස්වාදයක් ලබා ගැනීම සඳහාත් ජන කවිය නිර්මාණය වී ඇත.ජන කවිය නිර්මාණය කළ නිශ්චිත කතුවරයකු නොමැති අතර තම දිවි පෙවෙතට බෙහෙවින් සමීපව පවතින වස්තූන් තේමා කරගෙන කාව්‍ය නිර්මාණය කර ගෙන ඇත. ජීවිතයේ දහසකුත් දුක් කම්කටොළු කවියට නමින් මුඛ පරම්පරාගතව ව්‍යාප්ත වී ඔවුන් අතරේම ආරක්ෂා වී ඇත. වසර සිය ගණනක ඉතිහාසයකට උරුමකම් කියමින් පසු කාලීනව සරල පද කොටස් එක් කරමින් රිද්මයානුකූල හා තාලානුකුල චලන සමඟ ගැමි නැටුම් නිර්මාණය වී ජනයා අතර ජනප්‍රිය නර්තනාංගයක් බවට පරිවර්තනය විය. ත්‍රිවිධ රත්නයට හා දෙවියන්ට මුල් තැන ලබා දෙමින් පූජාර්ථය දනවන අයුරින් පද නිර්මාණය වී තිබීම මෙහි සුවිශේෂී ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකිය.

විෂය නිර්දේශයට අනුව පහත සඳහන් ජන ගායනා පිළිබඳ තොරතුරු ඉගෙන ගනිමින් ඒවා රසවත්ව ගයමු.

# රබන්

රබාන ඉන්දුනීසියානු ජාවක දූපත් වලින් අපට ලැබුණු දායාදයක් ලෙස බොහෝ විචාරකයින්ගේ අදහසයි. එරටෙහි "රමාන" වශයෙන් ව්‍යවහාරයේ පැවති භාණ්ඩය දේශීය අනන්‍යතාවයට අනුගතව සකස් වී දේශීය වාද්‍ය භාණ්ඩ නාමාවලියට ඇතුළත් වී ඇත. අනුරාධපුර, පොළොන්නරු, යාපහුව, මහනුවර වැනි යුගවලදී රබන් නැටුම ජනප්‍රිය නර්තනාංගයක් ලෙස පැවති බව පැරණි වංශකථාවල හා සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන් වේ. රබන් වර්ග රාශියක් වර්තමානයේ අප රටෙහි භාවිතවෙමින් පවතී.

- බංකු රබන්
- අත් රබන්
- විරිදු රබන්
- තැටි රබන් ( කැරකෙන රබන්)

ආදී වශයෙන් රබන් වර්ග රාශියක් දේශීය ජන සංස්කෘතිය තුළ ජනප්‍රිය වී ඇත. විනෝදාස්වාදය අරමුණු කොටගෙන කරනු ලබන සබ නැටුම් විශේෂයක් ලෙස රබන් නැටුම දේශීය නර්තන කලාව හා බැදී පවතී. එම නර්තනවලදී යොදා ගන්නා කවි රබන් කවි නැතහොත් රබන් ගී වශයෙන් හැදින්වේ. රබන් නැටුම සඳහා යොදා ගන්නා කවි විනෝදාස්වාදය පූජාර්ථය සහ සන්නිවේදනය යන අවස්ථාවන් සඳහා ද යොදා ගනු ලබයි. අවුරුදු උත්සව, මංගල උත්සව , සූවිසි විවරණ හා පෙරහැර සඳහා ද මෙම නර්තන යොදාගනු ලැබේ. විවිධ තාල රූප මත පදනම්ව බෝධිසත්ව චරිත, කාන්තා ලාලිත්‍ය හා ස්වභාව සෞන්දර්ය ද වර්ණනා කරමින් රබන් කවි රචනා වී ඇත.









01 නන් උතුම් පෙම්බර ගුණ රුසිරු රබානා

දැන් මෙමන් අතින් රැගෙන කරකවමි මනා

පෙම් සිතින් බලනු මැනවි දෙනෙත් පාමිනා

සන්තොසින් අසනු මැනවි කීම වෙන වෙනා

02 ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපේ මහ ගෞතම නම් මුණිඳු ................

ඒ බුදු වූ ගෞතම නම් මුණිඳු

දෙසූ දහම් ඇසුමට ඒ නිමලා - විසූ භවය යකුගෙන් තතු දැනලා

නසා ලන්ට කිවි දිවි අසලා බණ - දෙසූ විදුර පණ්ඩිතමයි ගෞතම

එදා ඒ ඇතු විදුමට ආ වැදි හට - පුදා ඒ දළ දෙක දීලා දැතට

සදා ඒ බුදු බව පැතු මාතා හට - පුදා වදිමු අපි මල් ගෙන දෝතට

## වන්නම්

උඩරට ,පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් තුනටම පොදු වූ නර්තනාංගයක් ලෙස වන්නම් දැක්විය හැක. මුල් කාලයේදී ගායනා සඳහාම නිර්මාණය වුව ද පසු කාලීනව සරල චලන හා පද කොටස් ඇතුළත් කරමින් නිමාවක් ඇති නර්තනාංගයක් ලෙස වන්නම් නිර්මාණය වී ඇත. වන්නම් යනු වැනුමක් නොහොත් වර්ණනා කිරීමකි. විවිධ වස්තූන්, විවිධ සතුන්, ස්වභාව සෞන්දර්ය, දෙවියන්, බුදුන්, කල්පිත වස්තූන් තේමා කරගෙන නිර්මාණය වී ඇති වන්නම් විවිධ තිත් රූප මත ගොඩ නඟමින් වර්ණනාත්මකව ගායනා කරනු ලැබේ. වර්තමානයේ වන්නම්, නර්තනය සඳහා යොදා ගත්ත ද ගායනයට සුවිශේෂ තැනක් හිමි වී ඇත. උඩරට වන්නම් මහනුවර යුගයේදී කවිකාර මඩුවේ ගායනය සඳහාත්, පහතරට ප්‍රචලිතව ඇති සින්දු වන්නම් දෙවුන්දර උපුල්වන් දේවාලයේ පුද පූජා වලදී ගායනය පිණිසත්, සබරගමු වන්නම් සබරගමු සමන් දේවාලයේ විනෝදාස්වාදය සඳහාත් රචනා වී ඇති බව සඳහන් වේ. තේමාවට උචිත වන ආකාරයෙන් නාද මාලා සකස් වී ඇති අතර වන්නම් ගායනයේ දී විවිධ රසයන් මතුවන ආකාරයෙන් ගායනා කිරීමට නර්තන ශිල්පීන් සමත් වී ඇත.

# ඔන්චිලි වාරම්

අවුරුදු කාලයේදී ජන ක්‍රීඩාවක් ලෙස ඔන්චිලි වාරම් යොදා ගැනීම ජන සංස්කෘතියේ සුලබව දක්නට ලැබේ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පොදු වූ ජන ක්‍රීඩාවකි. කතුරු ඔන්චිල්ලා, කැරකෙන ඔන්චිල්ලා, රැහැන් ඔන්චිල්ලා, බඹර ඔන්චිල්ලා, කූඩු ඔන්චිල්ලා සහ වැල් ඔන්චිල්ලා ආදිය දැකිය හැකිය. අතීතයේ සිට ගැමියෝ ත්‍රිවිධ රත්නයට හා පත්තිනි දෙවියන් ප්‍රධාන කොට දෙවියන්ට පුද පූජා පැවැත්වීමෙන් පසුව නියමිත වූ නැකැත්  වේලාවන්ට අනුව ඔන්චිල්ලා බැඳීම සිදු කරති. ඔන්චිලි වාරම්වල තුන් සරණේ කවි, බුදුගුණ දැනවෙන කවි ද මේ සඳහා යොදා ගැනේ. ඔන්චිලි වාරම් ආඝාතාත්මකව හා අනාඝාතාත්මකව සාමූහික වශයෙන් ගායනා කෙරේ. ඒකීය හඬ තලයක පිහිටා ගායනා කිරීම සුවිශේෂ ලක්ෂණයකි. දරා ගැනීමේ හැකියාව, අභියෝගවලට මුහුණදීමේ හැකියාව, සතුට හා විනෝදය මෙම ක්‍රීඩාව තුළ මතු වී පෙනේ.





01 පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා
දුර යන තරමට පුදුම නොවෙල්ලා
වැර සර පිරිමින් තව පැදපල්ලා
සුරපුර දෙවියනි රකු මෙ සියල්ලා

02 අටදෙන අටකොන වාඩි වෙයල්ලා
සිටගෙන දෙදෙනෙක් පොලු පාගල්ලා
වවුලන් ලෙස කැරකෙන ඔන්චිල්ලා
අපිත් පදිමු මේ රන් ඔන්චිල්ලා

## චාමර

රාජ සභාව තුළ පවන් සැලීම හෙවත් සෙමෙර සැලීම යන කාර්යය ඇසුරු කර ගනිමින් මෙම ගායනා විශේෂය නිර්මාණය වී ඇත. අඩියක් පමණ දිග රවුම් ලීයක අගට හණ හා නියැදවල සුසිනිඳු කෙඳි යොදා ගනිමින් සකස් කර ඇති මෙම චාමරය අතින් ගෙන නර්තනයේ යෙදේ. ගැමි ජීවිත හා සෘජුව බැඳී නොපැවතීම නිසා පුරාණයේ සිට භාවිතා කර ඇත්තේ බුද්ධ, දේව, රාජ යන ප්‍රශස්ති සඳහා වේ. බුදුන් වහන්සේගේ දෙපසින් සිට ගෞරව පිණිස දෙවි බඹුන් චාමර සැලූ බව බෞද්ධ පොත පතේ සඳහන් වේ. අද්‍යතනයේ දී මහනුවර දළදා පෙරහැරේ දන්තධාතූන් වහන්සේ වැඩම කරවන කරඬුව දෙපස දැලේ ඇතුන් පිට ගෞරව පිණිස හා භක්ති පෙරදැරි කොට ගෙන චාමර සැලීම සිදු කරයි.



01 සොබමන් දෙවිවරු සදෙනෙක් එතැනට

බසිමින් චාමර ගත්තේ සුරතට

ගනිමින් චාමර සැළුවේ මුනිඳුට


අපි දැන් දක්වමු ඒ රඟ සබයට

02 සුගත් මුණිඳු බුදුවන දා මරසෙන් බිඳ

ඇවිත් සුර බඹුන් රහසේ විදිමින් නඳ

දොහොත් නගා සාදුකාර දෙන මෙන් අද

රැගත් චාමරය සැළුවේ මුණිඳුන් හට



Download from
Dreamstime.com
This watermarked comp image is for previewing purposes only.

## නමස්කාර ගාථා

බුදුන් දහම් සඟුන් විෂයෙහි භක්තියෙන් යුක්තව වන්දනාමාන කිරීම සඳහා කරනු ලබන ගායනා විශේෂයයි. යතිය හා විරාම ලක්ෂණයන්ගෙන් යුක්තව විලම්භ ලයෙන් අනාඝාතාත්මක ලෙස ගායනා කරනු ලබයි. රචනා වී ඇත්තේ පාලි භාෂාවෙනි. මෙම ගාථා ගායනා කිරීමේදී භක්තිය, ගෞරවය,සංයමය යනාදී ගුණාංග මනාව මතු වී පෙනේ. සිංහල බෞද්ධ ජනයා සෑම සුභ කටයුතු වල දී මෙන්ම දේශීය නර්තන සම්ප්‍රදායන් හා බැඳි ශාන්තිකර්ම ආරම්භයේදී මෙම නමස්කාර ගාථා ගායනා කරනු ලැබේ.



**01** සම්මා සම්බුද්ධ ඤාණේන - සම්මා සම්බුද්ධ දේශනා

සම්මා සම්බුද්ධ ලෝකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ

**02** මේරුං විරාජිත සමන් විය බුද්ධ රාජාං

සිරි දන්ත සාගර සමන් විය ධම්ම රාජාං

සප්තකූට පබ්බත සමන් විය සංඝ රාජාං

සිරි බුද්ධ ධම්ම ගුණ සංඝ වරම් නමාමි

<u>ටීකා සී පද</u>

ටීකාවක් යන්නෙන් අදහස් කරන්නේ යම් සිදුවීමක්, තේමාවක් හෝ වඩාත් හොදින් විස්තර සහිතව පැහැදිලි වන ගායනා විශේෂයකි. ටීකාවල සුවිශේෂ ලක්ෂණයක් වන්නේ ගද්‍ය පද්‍ය කොටස් දෙකකින් සමන්විත වීමයි. මෙම කවි අනාසාතාත්මක හා අසාතාත්මක යන ලක්ෂණවලින් යුක්ත අතර, සී පදයේ එක් එක් පාදයෙන් කියවෙන කොටස ටීකාව මගින් වඩාත් විස්තර සහිතව අතිශෝක්තියෙන් මෙන්ම හුදී ජනයාගේ කාංසිය, පීඩාව දුරු කර ගැනීම සඳහා මෙම කවි ගායනා කරයි. හාස්‍ය රසය නිසා ඔවුන්ට විනෝදාස්වාදය ලබා ගැනීමටද අවස්ථාව සැලසෙනු ඇත.



**හෙමින් හෙමින්...............**

**තව ද ....... ඌරන්ට,** ගෝනුන්ට, මුවන්ට, සාවුන්ට වෙඩි තියන්න

වල්පාරක් දිගේ කිට්ටු කරගෙන යන්නා වාගේ.............

හෙමින් හෙමින් මම ගේකට යන කලට............

එකෙක් ඇවිත්..................

තව ද..............අත්තා, මුත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තා, සෝළියා, පාඩියා කාලේ මහා උස් කණාටු පොල් ගහකින් ගෙඩි පනහක් හැටක් සිඳහෙලන්නා වාගේ

එකෙක් ඇවිත්.............දුන්නයි මගේ.................පිට මැදට

ඒ ගුටි කකා..............

තව ද ...............නැන්දා මාමාගේ ගෙදර ගොස්

හොඳ හොද්දක් බතක් මාළුවක් පින්නක් කෑවා වාගේ........

ඒ ගුටි කකා................මම පිට වී යන කලට...........

මම්ම මටම.............

තව ද ............නැන්දා මාමා ආච්චි ආතා හූරා නෑනා කෙනෙක් සමග

සන්තෝෂ වේලාවකදී කොක් හඩලා සිනාසෙන්නා වාගේ.....

මම්ම මට ම ඉළ ඇට නැත හිනාවට

සැකසුම

T.A.K. ගුණසේකර

නර්තන උපදේශිකා